පටිච්චසමුප්පාදය (දහවෙනි කොටස)

21.07.2019 - ශ්‍රී ලංකාරාමය

නවසීලන්තය

හොඳයි අද මේ පින්වතුන්ට කියලා දෙන ධර්ම කාරණා ටික ඉතාමත්ම හොඳින් තේරුම් ගන්න හැකිවේවා! ධර්ම අවබෝධයත් ඒවගේම ධර්ම පුහුණු කිරීමක් ධර්ම වැටහීමක් ඇතිවේවා! මේ ප්‍රතිපදාවේ මනසිකාරයෙන් ගමන්කොට නිර්වාණ ධාතුව අවබෝධ කරගන්න ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා.

ඊයේ අපි කිව්වා සළායතන නිසා ස්පර්ශය ඇතිවෙන විදිය. සළායතන නිසා තමයි ස්පර්ශය හැදෙන්නේ, ආයතනයක් නැති කළ ස්පර්ශයක් ගොනු කරන්නේ නෑ.

ධර්ම අවබෝධය නැති නිසා දවසක් මට නෝනා කෙනෙක් මෙන්න මෙහෙම දෙයක් කිව්වා. 'ඵස්ස පච්චයා වේදනා' කියලා තිබෙනවා. එතකොට ස්පර්ශය නිසා තමයි කර්ම හැදෙන්නේ, ස්පර්ශය නිසා තමයි වේදනාවල් ඇතිවෙන්නේ, ස්පර්ශය නිසා සංඥාවල් ඇතිවෙන්නේ, ඒක නිසා ඒ නෝනට ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ ස්පර්ශය. මගෙන් ඇහුවා ස්පර්ශය නැති කරගන්න විදිය. නමුත් චක්ඛු ස්පර්ශය නැති කරගන්නම් ඇස් අන්ධ කරගන්න ඕනෑ. සෝත ස්පර්ශය නැති කරගන්නම් කන්වලට කූරු දෙකක් ගහ ගන්න ඕනෑ තුවාල වෙන්න. එතකොට ඇහෙන්නේ නෑ. ඒක හරියට ලාබෙට බෙහෙතක් කරගන්නවා වගේ. මට්ටකුණ්ඩලි කියලා කෙනෙක් හිටියා. එයාගේ තාත්තා අදින්න පුබ්බක, එයා හරි ලෝභයි, මසුරුයි. මට්ටකුණ්ඩලිට ලෙඩක් හැදුනට පස්සේ එයාගේ තාත්තා බෙහෙත් අහගත්තු විදියක් තිබුණා. එයා වෙද්දු ගාවට ගිහිල්ලා "බඩේ අමාරුවක් හැදුනහම මොන වගේ බෙහෙතක්ද සාමාන්‍යයෙන් හොඳ" කියලා අහනවා. ඒවගේ එක එක ලෙඩ වලට දෙන බෙහෙත් වර්ග ඒ අයගෙන් අහනවා. එයාගේ තිබෙන ලෝභ කම දැනගෙනම එක එක අය එක එක බෙහෙත් වර්ග කිව්වා. මුල් ගැන කිව්වා පොතු ගැන කිව්වා දළු ගැන කිව්වා. ඔය වගේ එක එක දේවල් කිව්වා. ඒවා අහගෙන ඇවිල්ලා තලලා කොටලා මට්ටකුණ්ඩලිට දුන්නා. එයාට ලෙඩේ වැඩි උනා. ලෙඩේ වැඩි වෙලා මට්ටකුණ්ඩලි මැරුණා. ඔය මගෙන් ප්‍රශ්න අහන කට්ටියත් ඔන්න ඔය වගේ කට්ටිය. අදින්න පුබ්බකගේ නෑදෑයෝ. 'මේ වගේ එකක් තිබෙනවා ස්වාමීන්වහන්ස කොහොමද කරන්නේ' කියලා ඇහුවා. එයාට ඵස්සය ප්‍රශ්නයක් වෙලා. දැන් එයාට නැති කරගන්න ඕනෑ අවිද්‍යාවත් නොවෙයි තණ්හාවත් නොවෙයි උපාදානයත් නොවෙයි, ඵස්සය. නමුත් බුදුරජාණන් වහන්සේ දේශනා කළේ ස්පර්ශය නැති කරන්නද? සපර්ශය නැති කරන්න බෑ. නැති කරන්න තිබෙන්නේ අවිද්‍යාව සහ තණ්හාව. ඒ දෙක තමයි නීවරණ ධර්ම හැටියට තිබෙන්නේ. ඒක නැති කරන්නේ නැතුව වෙන තැනක් තමයි නැති කරන්න බලන්නේ. කවදාකවත් ස්පර්ශය නැති කරන්න බෑ. රහතන්වහන්සේලාටත් ස්පර්ශය තිබෙනවා. රහතන්වහන්සේලාට චක්ඛු ස්පර්ශයත් තිබෙනවා, සෝත ස්පර්ශයත් තිබෙනවා, ඝාණ ජිව්හා කාය මනෝ සපර්ශ තිබෙනවා. ඒක නිසා තමයි රහතන්වහන්සේලා රූප දකින්නේ, බණ අහන්නේ ආහාර පාන වල ගුණ අගුණ කියන්නේ ලුණු රස තිත්ත රස දැනේන්නේ. අපිට නැති කරන්න තිබෙන්නේ උපාදානය සහ තණ්හාව. මේ වගේ වැරදි බණ තිබෙනවා. ඒවගෙන් පරෙස්සම් වෙන්න ඕනෑ.

තවත් කෙනෙක් මට මෛත්‍රීය කියලා දුන්නා. ඒ තමයි, එයා බලනවා සත්වයන්ගේ තිබෙන ස්වභාවය. සත්වයෙක් ගත්තහම අතපය තිබෙනවා ඇස් දෙකක් තිබෙනවා. එයා හිතනවා, 'ඇස් දෙකක් තිබෙන නිසා තමයි මට පේන්නේ, කන් දෙකක් තිබෙන නිසා තමයි අපි යමක් අහන්නේ. නාසය තිබෙන නිසා තමයි ගඳ සුවඳ දැන ගන්නේ, කය නිසා තමයි මම මේ ස්පර්ශය දැන ගන්නේ, හිත තිබෙන නිසා තමයි මම මේ විදියට හිතන්නේ, මගේ අත් දෙක තිබෙන නිසා තමයි මම වැඩක් පලක් කරගන්නේ, පා තිබෙන නිසා තමයි මම යන්නේ' කියලා හිතලා මෙයා අත් දෙක සුවපත් වේවා කියලා මෛත්‍රීය වඩනවා. ඇස් දෙක සුවපත් වේවා, කන්දෙක සුවපත් වේවා, පා දෙක නිරෝගී වේවා කියලා මෛත්‍රීය වඩනවා. මේ භාවනාවේ මුල ඉඳලා අග දක්වාම තිබෙන්නේ පරම ආත්මාර්ථකාමී ගතිය, selfish ගතිය. වෙන කිසිකෙනෙකුට මෛත්‍රීය වඩන්නේ නෑ. තමන්ගේ අත් දෙකටයි තමන්ගේ පා දෙකටයි ඇස් දෙකටයි

කනටයි තමයි එයා මෛත්‍රීය කරන්නේ. මේ දෙස උඩින් බැලුවහම ජේන්නේ බණ නමුත් ඇත්තටම තිබෙන්නේ selfish ගතිය. 'සියලු සත්වයෝ සුවපත් වේවා' කියලා අනිත් අයට මෛත්‍රී කරන්නේ නෑ. අතට පයට නාසයට අනිත් ඉන්ද්‍රිය ධර්ම වලට සෙත් පතමින් ඉන්න එක තමයි කරන්නේ. ඒකෙන් වැඩෙන්නේ ආත්ම සංඥාව. ලෝභ කමයි ඒ තුලින් වැඩෙන්නේ. ඇත්තටම අපි මෛත්‍රීය වඩන්නේ සත්ව සංඥාවටයි. සත්වයන්ටයි අපි සැප වේවා කියලා පතන්නේ. ඔය වගේ තිබෙනවා අමුතු විදියේ බණ සහ බණ කියලා කියන්නා වූ දේවල්. ඒක නිසා ඒවට අහුවෙන්නේ නැතුව නියම ධර්මය දැන ගන්න.

දැන් පටිච්චසමුප්පාදය ගැන කරුණු ටිකක් කියලා දෙන්න ඕනෑ. ඊයේ මම කිව්වා ආයතනයක් නිසා කොහොමද ස්පර්ශය සකස් වෙන්නේ කියලා. ස්පර්ශය කියලා කියනේ සිතට සම්බන්ධ එක්තරා වේග ගතියක්. ස්පර්ශය නිසා හිතේ ඇතිවෙනවා විඳින ගතියක්. ඒක තමයි වේදනාව කියන්නේ. මෙතනදී **ඵස්ස පච්චයා වේදනා** කියලා ගන්නේ විශේෂයෙන්ම විපාක සිත්. විපාක සිත් තිබෙනවා 32ක්.

අහේතුක අකුසල විපාක	7
අහේතුක කුසල විපාක	8
කාමාවචර කුසල විපාක	8
රූපාවචර කුසල විපාක	5
අරූපාවචර කුසල විපාක	4
	32

මේ විපාක සිත් 32 කේ තිබෙනවා ඵස්ස චෛතසික 32ක්. මේ ඵස්ස 32 ට තමයි **සළායතන පච්චයා ඵස්සො** කියලා කියන්නේ. හේතුව, ඇසක් හැදෙනකොට ඒ ඇස හැදිලා තිබෙන්නේ විපාකයක් නිසා. ඇස ඉස්සර කරපු කර්මයක ප්‍රතිඵලයක්. ඒක නිසා ඇතිවෙන චක්ඛු විඤ්ඤාණයත් විපාකයක්, ස්පර්ශයත් විපාකයක්. ඒ විපාක සිතේ තිබෙන ස්පර්ශය තමයි ඵස්සය කියලා කියන්නේ, **සළායතන පච්චයා ඵස්සො.**

අද පින්වතුන්ට කියලා දෙන්නේ මේ විපාක සිත්වල තිබෙන වේදනාව ගැන. මේ සිත් වල තිබෙනවා තිබෙනවා වේදනාවල් 32ක්. ඒ වේදනාවල් 32ට කියනවා ස්පර්ශය නිසා ඇතිවෙන්නා වූ වේදනාවල් කියලා. **'ඵස්ස පච්චයා වේදනා'** කියලා කියන්නේ ඒකට. ඒක **චක්ඛු සම්පස්සජා වේදනා** කියලා තමයි දේශනාවේ තිබෙන්නේ. **සම්පස්සජා වේදනා** කියලා කියන්නේ 'ස්පර්ශයෙන් උපදින වේදනාව' කියන එක = හැපිච්ච ගමන්ම ඇතිවෙන වේදනාව. ඇත්තටම මේ ස්පර්ශය කියලා කියන්නේ යම්කිසි දෙයක් එකට වීම, එකට වෙනකොටම ඇතිවෙනවා වෙනම වේදනාවක්. ඒක චක්ඛු සම්පස්සජා වේදනා, සෝත සම්ඵස්සජා වේදනා ආදී වශයෙන් තමයි කියන්නේ. මේ වේදනාව ආයතන වශයෙන් 6ක් වෙනවා. මේ වේදනාව කියන එක හැම සිතකම තිබෙනවා. නමුත් මෙතැන සලකන්නේ විපාක සිත් 32 කේ තිබෙන වේදනාව පමණයි.

අපිට සිතුවිලි පහළ වෙනකොට සිතේ තිබෙන වේගය කොච්චරද කියලා කවුරුවත් කියන්න දන්නේ නෑ. එක මැන ගන්න බෑ. ඒ තරම් වේගයකින් ගලාගෙන එනවා. එක නිසා මේ හිත මෙහෙමයි මේ හිත මෙහෙමයි කියලා කියන්න පුළුවන් හයියක් අපිට නැති බව අපි තේරුම් ගන්න ඕනෑ. මේ සිත් ඇතිවෙන කොට කිසිම පූර්ව සංවිධානයක් නැතුව එක පාරම පහළවෙන සිත් තිබෙනවා. හිතලවත් නැති ඒවා එකපාරටම එනවා. අනිත් එක තමයි පරණ දැකපු අහපු දේවල් වල replica වල් හැටියට පිටපත් හැටියට එනවා, ඉස්සර දැකපු එකක් අහපු එකක් මතක් වෙලා ඉස්සරහට එනවා. සමහර වෙලාවට අපි කිසිම විදියකට හිතලවත් අහලවත් නැති දේවල් එක පාරටම හිතට එනවා. සමහර වෙලාවට තිබෙනවා අපි දැකපු එකක් හිතට ආවහම ඒක අපි modify කරගන්න ගතිය. අපිට යම්කිසි දෙයක් මතක් උනහම ඒ මනෝමය පින්තූරයට අනුව ඒක දැකපු තැන, දැකපු කෙනා සහ ඒ සිද්ධිය අරගෙන ඒක තව modify කරමින් වෙන art work එකක් කරගෙන යනවා. මේ විදියට එක එක ඒවා සම්බන්ධ කරමින් ඈතට යනවා. සමහර ඒවා තිබෙනවා හිතට ආවහම යන්නේ නැතුව සිතේ කා වදිනවා. සමහර ඒවා තිබෙනවා

හොඳයි කියලා ගත්ත එකක් හරි නරකයි කියලා හිතට වැදිච්ච එකක් ගැන අනාගතයට සිතුවිලි හදනවා. උදාහරණයක් විදියට අපි හිතමු අධ්‍යාපනය කියලා. මේ විදියට පාඩම් කරන්න මේ විදියට විභාග කරන්න, මේ විදියට ඩිප්ලෝමා කරන්න මේ විදියට degree එක කරන්න කියලා අදහසක් දාපු ගමන් ඒකට අනුව මෙහෙම මෙහෙම කරනවා කියලා අපි අනාගතයට හිතනවා. මේ විදියටත් සිතුවිලි නිර්මාණය කරනවා. මේ සිත් වල කර්ම ශක්තිය තිබෙනවා. සමහර ඒවා කුසල වෙනවා සමහර ඒවා අකුසල වෙනවා. මේ විදියට හිත වේගවත් කරනකොටත් සිතුවිලි පහළ වෙනවා. ඔය හැම සිතකම යම් කිසි වේදනාවක් යම්කිසි ස්පර්ශයක් ඇතිවෙනවා. තේරුම් ගන්න අමාරුම දේ තමයි අපේ හිතේ පහළ වෙන අදහස් එක්ක ස්පර්ශය කොහොමද පහළ වෙන්නේ කියලා. ඒ කියන්නේ 'හිතයි' 'අදහසයි' දෙකම තිබෙන්න එක ළඟ. ඇස කන නාසය දිව ශරීරය කියන ඒවා ටිකක් තේරුම් ගන්න ලේසියි. හේතුව door එකයි object එකයි එකිනෙකට ඈත තිබෙන නිසා. හැබැයි මනස තේරුම් ගන්න ටිකක් අමාරුයි. හේතුව, Object එකයි subject ට එකයි එක ළඟ තිබෙන නිසා. හැබැයි හොඳට සිහියෙන් නුවණින් මෙනෙහි කරනකොට ඕක තේරුම් ගන්න පුළුවන්. හොඳ අවධානයක් හොඳ විදර්ශනා නුවණක් හොඳ බෙදීමක් දැම්මට පස්සේ ඕක තේරුම් ගන්න පුලුවන්.

සමහර අය අරමුණට හිත කියලා කියනවා. එතකොට ඒක ප්‍රශ්නයක් වෙනවා. අරමුණ කියලා කියන්නේ හිත නොවෙයි. අරමුණ කියලා කියන්නේ හිතට දැනෙන දේ. හිතන දෙය හෝ හිතට වැටහී යන හෝ හිතට දැනීයන දේට කියනවා අරමුණ කියලා. අරමුණ උඩට තමයි දැනෙන ගතිය හෙවත් දැනෙන ලක්ෂණය පතිත වෙන්නේ. යම්කිසි අරමුණක් තිබෙනවා නම් මේ දැනගන්නා ගතිය ගිහිල්ලා ඒ අරමුණ වහගන්නවා. හිතේ තිබෙන්නේ 'හිතවන ගතියයි' 'දැනගන්නා ගතියයි'.

අරමුණක් තිබෙනවා, හිත ඒ අරමුණට ගිහිල්ලා අරමුණ උඩට පතිත වෙනවා, ඊට පස්සේ ඒ අරමුණ දැනගන්නවා. දැනගන්නා ගතිය හෙවත් සිත සහ සිත එක්ක තිබෙන්නා වූ චෛතසික ගති සම්භාරයක් එක්ක පොදියට ගිහිල්ලා අරමුණ උඩට පතිත වෙනවා. නමුත් අරමුණ නොවෙයි හිත. අරමුණ කියලා කියන්නේ ඒ දැනගන්නා හිතට දැනෙන දේ. මේ දෙක කඩාගන්න පුළුවන් කම අපිට තිබෙන්න ඕනෑ. මේ ස්වභාව ධර්ම දෙක එනම් 'දැන ගන්නා හිතයි' 'දැනීයන අරමුණයි' කියන දෙක වෙනම හඳුනාගන්න පුළුවන් නම් බෙදාගන්න පුළුවන්නම් subject සහ object කියන දෙක හඳුනාගන්න පුළුවන්. සමහර අයට ඒ ගතිය ටිකක් අඩුයි. ඒකනිසා සමහර අය අරමුණට කියන්නේ හිත කියලා.

මම තවත් එකක් කියන්නම්. මේක බටහිර තිබෙන දෙයක්. මේක මේ ජීවිත වලට ප්‍රයෝජනවත්. Subjective සහ objective කියලා දෙකක් තිබෙනවා. ඕනෑම කාරණයක් අපිට objectively සහ subjectively බලන්න පුළුවන්. අපි බලමු කොහොමද එහෙම බලන්නේ කියලා. එළියේ තිබෙනවා දොඩම් ගහක්, ඒ දොඩම් ගහෙන් එක්කෙනෙක් ඇවිල්ලා දොඩම් කඩාගෙන යනවා. එතකොට අපි කියනවා 'එයාට බඩගිනි වෙලා වෙන්න ඇති, ඒක එයාගේ කාරණයක්, ඒක එයාගේ වැඩක් කියලා අපි objectively ඒ දෙස බලනවා.

ඊළඟට subjectively බලනවා කියලා කියන්නේ අපි හිතමු මෙතැන තිබුණ මේසය කවුරුහරි වෙන වැඩකට අරගෙන යනවා. එතකොට අපි කියනවා 'එහෙම ගෙනියන්න බෑ, ඒකෙ අපේ පොත්පත් තිබෙනවා, අපි තමයි ඕක පාවිච්චි කරන්නේ' කියලා අපි අපේ views දානවා. අපි අපේ අදහස් දාලා ඒක අපේ කරගන්නවා. ඒකට අයිතිකාරයෝ වෙලා තීරණයකට එනවා. මේ විදියට යම් කිසි කාරණයක් subjectively සහ objectively බලනවා.

දැන් තවත් කාරණයක් කියන්නම්, රාවණා රජ්ජුරුවෝ නැති වෙලා දැන් අවුරුදු කීයක් වෙනවද? සමහර අයට රාවණා රජ්ජුරුවෝ කියන එක legendary චරිතයක් විතරයි. නමුත් සමහර අයට ඒක legendry කථාවක් නොවෙයි. ඒ අයට ඒ ගැන එක එක මත තිබෙනවා. 'අපේ තාත්තාගේ පරම්පරාවේ කට්ටිය' කියලා සම්බන්ධ කම් පෙන්වනවා. ඒවාට කියන්නේ මත කියලා. මත ගැට ගහලා තමන්ගේ අදහස් දාලා තමන් ඒකෙ කොටස් කාරයෙක් වෙනවා. ඒකට කියනවා subjectively බලනවා කියලා. නමුත් ඒක

objectively බැලුවහම ඇලීම අඩුයි, ගැට හැදෙනවා අඩුයි. Subjectively බැලුවහම රණ්ඩු වැඩියි. ගොඩක් බලන්නේ ඔය විදියට, ඒක සිද්ධියක් හැටියට බලන්නේ නෑ.

අරමුණක් ගත්තට පස්සේ ඒ අරමුණ තමයි හිතට දැනෙන දේ. ඒක සද්දයක් වෙන්න පුළුවන් රූපයක් වෙන්න පුළුවන් ආඝ්‍රාණයක් වෙන්න පුළුවන් සිතුවිල්ලක් වෙන්න පුළුවන්. ඒ අරමුණ තමයි object එක. ඒ අරමුණ දැන ගන්නා හිත තමයි subject එක. අපේ හිතට අරමුණක් ආවට පස්සේ හරියටම ඒ ආරම්මණයට හිත ගිහිල්ලා වැදිලා හැපිලා ඒකෙ ඇලිල වගේ තමයි තිබෙන්නේ.

අපි මනෝමය ධර්මය හොඳට අඳුර ගන්න ඕනෑ. ඇස් දෙක පියා ගත්තහම අපිට මනස තුල මොනවා හරි දෙයක් දැනෙනෙවා. ඒ දැනෙන දේ තමයි 'අරමුණ'. අපි ඇස් දෙක පියාගත්තහම අපිට 'නැති බවක්' 'හිස් බවක්' දැනෙනවා. ඒ නැති බවත් අරමුණක්, object එකක්. ඒ නැති බව කියන එක තේරුම් ගියේ එය දැන ගන්නා හිතටයි. නැති බව කියන එක දැනී ගියේ එවැනි ආකාර ස්වරූපයක් ඒකෙ තිබුණ නිසයි. ඒකට කියනවා 'අරමුණ' කියලා. මේ අරමුණ අපිට පේන්නේ අපේ මුහුණට ඉස්සරහ පැත්තෙන්. ඒ දෙස බලන 'හිත' ඇතුලේ සිට පිට පැත්තයි බලන්නේ. ඒ විදියට තමයි මේක අපිට දැනෙන්නේ.

- එතකොට අපි දැන ගන්න ඕනෑ ඒ දැන ගන්නා ස්වභාවය, දැන ගැනීමේ ක්‍රියාව සිදු කරන්නේ ඇතුලේ සිට පිට පැත්තට බව.
- දැනෙන දේ දැනෙන්නේ පිට පැත්තෙන්.

මේ විදියට කාරණා දෙක හොඳට දැන ගත්තට පස්සේ දැන ගන්නා ගතිය හෙවත් දැන ගන්නා වූ ශක්තියෙන් යුක්ත වූ සිත ඇතුල් පැත්තේ ඉඳලා එළියේ තිබෙන දේවල් දැන ගන්නවා. සිතෙන් කරන්න පුළුවන් දෙය තමයි ඒක. එළියේ ඉඳලා ඒ දැනෙන දෙය ඇතුල් පැත්තට යොමුවෙලා හැරිලා තිබෙන විදියට අපිට දැනෙනවා. ඒක පාටක් වෙන්න පුළුවන්, අඳුරක් වෙන්න පුළුවන්, හිස් බවක් වෙන්න පුළුවන්, dots වෙන්න පුළුවන් stars වෙන්න පුළුවන්, මොනවා හරි දෙයක් වෙන්න පුළුවන්. නමුත් 'හිත' ඒ සෑම දෙයක්ම ඒ ඒ වෙලාවේ දකිනවා. එලෙස දැන ගන්න නම් ඒ 'ආරම්මණය' 'දැන ගන්නා ගතිය කියන සිතත් සමග සම්බන්ධ (connect) වෙන්න ඕනෑ. අන්න ඒ ගතියට කියනවා ස්පර්ශය කියලා. ස්පර්ශය නැත්නම් දැන ගන්න බෑ. දැන ගන්නා ගතිය හෙවත් සිත ඒ ආරම්මණයේ හැපෙන්න ඕනෑ. එතකොට හොඳටම තේරෙනවා මම ඇස් දෙක පියා ගත්ත කල මගේ සිත ගිහිල්ලා ඒ තිබෙන්නාවූ කළුවරේ හැප්පිලා, ඒක නිසා තමයි දැනුනේ කියලා. මේ වගේ 'සිතත්' ඒ 'සිතේ තැවරිලා තිබෙන අරමුණත්' අපි වෙන්කරලා දැන ගන්න ඕනෑ.

මම මේ කරන්නේ අපි පුරුදු කරන විදියට ධර්මයේ තිබෙන විදියට යන්න පාර කියන එක විතරයි. නමුත් මේ පින්වතුන් මේක කරලා බලන්න ඕනෑ. පර්යේෂණය කියලා කියන්නේ මොකක්ද? පර්යේෂණය කරනවා කියන එකයි පරීක්ෂා කරනවා කියන එකයි දෙකක්. පර්යේෂණය කියලා කියන්නේ research කරන එක. යම්කිසි දෙයක් හොයාගෙන හොයාගෙන යන process එකක් ඒක. ඒකට කාලයක් තිබෙනවා. පරික්ෂා කරනවා කියලා කියන්නේ වෙන එකක්. තිබෙන දෙයක් examine කරනවා කියන එකටයි පරික්ෂා කරනවා කියන්නේ. ඒක නිසා පරික්ෂා කරනවා කියන එකයි පර්යේෂණය කරනවා කියන එකයි දෙකක්. නමුත් මේකේ පර්යේෂණය කරන්න දෙයක් නෑ. අපි කරන්න ඕනෑ වෙන්නේ අවධානයෙන් යුක්තව මේ සිදුවීම් සිදුවෙන ආකාරය දැන ගන්න එක.

අපි මේ කියන්නා වූ විපාක සිත් 32 ම තිබෙනවා වේදනාවල් 32ක්. ඒකට කියනවා **ඵස්ස පච්චයා වේදනා** කියලා. ස්පර්ශයක් ආපු ගමන්ම ස්පර්ශයට අනුකූලව වේදනාවක් ඇතිවෙනවා. දැන් අපි කිව්වා ඇස් පියාගත්තහම කළුවර ගතියක් දැනෙනවා කියලා, හිස් බවක් දැනෙනවා කියලා, ඒකෙ වේදනාව අඳුර ගන්නේ කොහොමද? ඒ සිත් වල තිබෙන්නේ උපේක්ෂා වේදනාව. අපිට වලාකුල් පේනවා අහස පේනවා. අපිට දැන් වලාකුල් දැකලා දැකලා ඒවාට ලෝභ චේතනා ඇතිවෙන්නේ නෑ. අපිට වලාකුල් දැක්කහම ඇතිවෙන්නේ උපේක්ෂා ස්වභාවයක්. සමහර වෙලාවට විතරක් කෙනෙක් හැන්දෑවට සහ උදේට ලා රතු

පාටට වලාකුළු පේනකොට කැමැත්තක් ඇතිවෙලා ෆොටෝ ගහන්න යනවා. ඒ හැර අනිත් ඒවා උපේක්ෂා සහගතයි. නමුත් ඒ රතුපාට පුද්ගලයාගෙන් පුද්ගලයාට දැනෙන විදිය වෙනස්. හැමදාම මේ රතුපාට එළිය දකින මනුස්සයෙක් ඉන්නවා. Tourist ලා ඒ එළිය දකින්නේ සැප එළියක් විදියට. නමුත් ඒක හැමදාම දකින මනුස්සයට උපේක්ෂා වේදනාවක් වෙනවා. එයාට ඒක නරකකුත් නෑ, හොඳකුත් නෑ. ඒක නිසා පුද්ගලයාගෙන් පුද්ගලයාට වේදනාව හැදෙන හැටි වෙනස්. **සළායතන පච්චයා ඵස්සො - ඵස්ස පච්චයා** වේදනා කියලා කියන්නේ ඕන්න ඔය විදියටයි.

තවත් එකක් කියලා දෙන්නම්.

කෙනෙකුගේ සිතට ඉස්සෙල්ලාම රූපයක් වදිනකොට පහත සඳහන් ආකාරයට චිත්ත වීථියක් හට ගන්නවා. මේ චිත්ත වීථියේ ඇස සම්බන්ධ වෙලා හට ගන්නේ චක්ඛු විඤ්ඤාණය පමණයි. අනිත් සිත් එනම් භවාංග - භවාංග චලන - භවාංග උපච්ඡේද - පංච ද්වාරාවජ්ජන ආදී ඔක්කොම පහළ උනේ හෘදය වත්ථුව ආධාර කරගෙන. ඊට පසුව හෘදය වස්තුවෙන් මාරුවෙලා තමයි ඇසේ චක්ඛු විඤ්ඤාණය පහළ උනේ. ඊට පස්සේ චක්ඛු විඤ්ඤාණයෙන් ගත්ත රූපය අරගෙන නැවතත් සිත් හෘදය වස්තුවේ පහළ වෙනවා.

1) රූපය සම්බන්ධයෙන් පළමුවෙන්ම පහළ පංචද්වාර චිත්ත වීථිය.

භ	ච	උ	ප	ච	ස	සං	වො	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත



කෙනෙකුගේ ඇසේ රූපයක් හැපුනහම පංච ද්වාරාවජ්ජන චිත්ත වීථියක් පහළවෙනවා. මේ පළවෙනි චිත්ත වීථියෙන් ගත්ත රූපය දෙවෙනුව මනසේ වදිනවා.

2) චක්ඛු විඤ්ඤාණයෙන් ගත්තු රූපයම තහවරු කරමින් පහළ වෙන මනෝද්වාරික චිත්ත වීථිය.

භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ

3) දෙවෙනි වීථියෙන් ගත්තු රූපයේ නම කුමක්දැයි කියලා දැන ගනිමින් මනසේ පහළ වෙන දෙවෙනි චිත්ත වීථිය.

භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ

4) ඉස්සෙල්ලා ගත්තු අරමුණේ අර්ථය සලකමින් පහළ වෙන තුන්වෙනි මනෝද්වාරික චිත්ත වීථිය.

භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ

5) පස්වෙනි චිත්ත වීථියට එනකොට අරමුණේ නම ගම හොඳට හිතට වැදිලා ඉවරයි.

භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ

කෙලෙස් සකස් වෙන ස්ථානය

පළවෙනි වීථියේ සිට හතර වෙනි වීථිය දක්වා චිත්ත වීථිවල තිබෙන ජවන් සිත් වලත් චේතනා ශක්තිය තිබෙනවා. නමුත් ඒවායේ කර්ම ශක්තිය එතරම් හයිය නෑ. ඒවා අර්ථ සලකන සිත්. නමුත් පස්වෙනි වීථියේ ජවන් සිත් ඉතාමත් බලවත් කෙලෙස් වැක්කෙරෙන තැනක්. මානය ලෝභය තරහව පිළිකුල ආදී සියලුම කෙලෙස් ගලන්නේ මේ ජවන් සිත්වල. පස් වෙනි වීථියට එනකොට යෝනිසෝමනසිකාරය පුරුදු කරලා නැත්නම් එතැනදී තමයි තණ්හාවෙන් ගන්න ලෝභයෙන් ගන්න ආශ්‍රවයන් ගලන තැන. කෙනෙකුට තර්ක කරන්න පුළුවන් ඇයි අනිත් සිත්වල නැතුව පස්වෙනි වීථියේ විතරක් කෙලෙස් හැදෙන්නේ කියලා. ඒකට හේතුව තමයි යම්කිසි දේකට කෙලෙස් හැදෙන්න නම් අරමුණ හොඳට හිතට වැදිලා හොඳට හිතට හසුවෙලා තිබෙන්න ඕනෑ. අරමුණ හොඳට හිතට වැදිලා තිබුණේ නැත්නම් තණ්හාවෙන් උපාදානයෙන් බැඳීමක් වෙන්නේ නෑ. මේක එක්තරා විදියක ධර්ම විග්‍රහයක්.

ඉහත සඳහන් චිත්ත වීථිවල දෙවෙනි වීථියේ සිට පස් වෙනි වීථිය දක්වා ඇති වීථි 4 මනෝද්වාරිකයි. අපි යම්කිසි දෙයක් බලපු ගමන් ඒක හිතේ කොටාගන්නවා. ඊට පස්සේ ඒ කොටාගත්ත එක තමයි හිතේ දුවවන්නේ. උදාහරණයක් විදියට ගත්තොත් දඹු ලේන්නු යම්කිසි දෙයක් කනකොට ඒක අත්දෙකෙන්ම අල්ලාගෙනයි කන්නේ. අපි හිතමු පොඩි පේර ගෙඩියක් කනවා කියලා. එයා ඒ පේර ගෙඩිය අත්දෙකෙන්ම අල්ලාගෙන එක පාරක් ඒක කටින් කඩාගෙන ඒ කටට ගත්ත ටික නැවතත් කීප සැරයක්ම හපනවා. මේ චිත්ත වීථි පෙළේදීත් වෙන්නේ ඒ වගේ දෙයක්. පළවෙනි වීථියෙන් අරමුණ කොටා ගන්නවා අනිත් වීථි හතර ඒ අරමුණම අරගෙන පහළ වෙනවා. නැවතත් අරමුණක් ගන්නවා. ඒ අරමුණම අරගෙන මනෝද්වාරික චිත්ත වීථි හතරක් පහළ වෙනවා. ඒක නිසා මේ විස්තරයට අනුව හෘදය වස්තුව අධාරකරගෙන පහළ වෙන චිත්ත වීථි 4 ක් තිබෙනවා. හැම වෙලාවේම කෙලෙස් පොදි ගැහෙන්නේ ඇතුලතින් තදින් පදම් කරල ගන්න නිසයි.

මෙහෙමත් හිතලා බලන්න. අපි ෆෝන් එකෙන් ෆොටෝ එකක් ගන්නවා. ඒ ගත්තු ෆොටෝ එක අපි පස්සේ edit කරනවා. මෙහෙම edit කරන්න පුළුවන්කම තිබෙන්නේ ඉසෙල්ලා අරගෙන ඇතුලත තිබෙන ෆොටෝ එකයි. ඒ වගේ අපි අරමුණු ඇතුලට අරගෙන පසුව ඒ අනුව කෙලෙස් ගොනු කරනවා.

- මේ සිත් පේළි පහේ ඇති ජවන් සිත් වලින් රැස්කරන කර්ම ශක්තීන් අතරෙන් ඉතාම බලවත් වෙන්නේ, කර්ම පථ බවට පත්වෙන්නේ පස්වෙනි චිත්ත වීථියේ ඇති ජවන් සිත් වලින් රැස් කරන කර්ම ශක්තියයි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස දිට්ඨෙ දිට්ඨමන්තං කියලා ධර්මයක් දේශනා කරලා තිබෙනවා. ඒක මොන අවස්ථාවද?

<u>පිළිතුර</u> - දිට්ඨෙ දිට්ඨමන්තං කියලා කියන්නේ රූපයක් දැක්කා නම් ඒ රූපය දැක්කා එතනින් ඒක ඉවරයි කියලා නුවණින් දකින්න ඕනෑ. මේ චිත්ත වීථි පහෙන් ඉස්සෙල්ලා ඇතිවෙන සිත් නවත්වා ගන්න බෑ. ඒවා

චිත්ත නියාමයට අනුව කොහොමටත් පහළ වෙන සිත්. පස්වෙනි චිත්ත වීථියේදී තමයි කර්ම නොසැදීම පිණිස සිත හසුරුවන්න ඕනෑ.

අපි යම්කිසි දෙයක් දැක්කොත් ඒක නොදැකපු දෙයක් බවට පත්කරන්න බෑ. දැකපුදේ දැක්කා. ඒක ඇත්තක්. නමුත් ඒ දැකපු දේ අරගෙන හොඳයි නරකයි වශයෙන් ඇතුලත තව කථා හදන්න, පිංතූර හදන්න හොඳ නෑ. අපේ සිත ස්වභාවයෙන්ම දැකපු දේ අහපු දේ සිතපු දේ හොඳ හැටියට, නරක හැටියට, මාන්න හැටියට දෘෂ්ඨි හැටියට අර්ථ ගන්නනවා. ඒකට කියනවා කෙලෙස් හදනවා කියලා. මේ දේ කරන්න යන්න හොඳ නෑ. නමුත් දැකපු දේ අරමුණු කරගෙන සිත් පහළ වෙන එක අපිට නවත්වන්න බෑ.

බුදුරජාණන්වහන්සේ දිට්ඨෙ දිට්ඨමත්තං කියන තැනදී දේශනා කරලා තිබෙන්නේ objectively බලන්න කියලා. නමුත් අපි කරන්නේ ඒවා 'මගේ' කරමින් ආත්ම දෘෂ්ඨියත් ඒකට වද්දලා බලන එක. ඒක නිසා අපි අතරමං වෙනවා. Objectively බලනවා කියන්නේ ඒක යම්කිසි රූපයක් හරි සද්දයක් හරි කියලා දැනගන්නවා, එච්චරයි.

සැම අරමුණක් සම්බන්ධයෙන්ම පහත සඳහන් අයුරින් චිත්ත වීථි 5 හ 5හ බැගින් පහළ වෙනවා.

භ	ච	උ	ප	ච	ස	සං	වො	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ

භ	ච	උ	ප	ච	ස	සං	වො	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ

භ	ච	උ	ප	ච	ස	සං	වො	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ
භ	ච	උ	ම	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත	භ	භ	භ	භ

මේ විදියට පහළ වෙන සිත් වලින් පළවෙනි කාණ්ඩයේ අවසාන සිත් වලින් Objectively බැලුවානම් දෙවෙනි කාණ්ඩයේ අවසාන ජවන් සිත් වලට එනවිට එය තවත් බලගැන්වෙනවා. ඒක හරියට කැවුම් හදන කොට මුලදී මුලදී හදන කැවුම් ඇදකුද සහිතයි. ඒවා එහෙම වෙන්නේ ඒ කැවුම් හදන හැන්දයි පිටි මිශ්‍රනයයි සියල්ලම එයාට තවම අලුත් නිසා. ඒක නිසා මුලදී දෙකක් තුනක් හදලා දැනගන්නවා මෙන්න මේ විදියටයි ඕක කරන්න ඕනෑ කියලා. එතකොට පස්සේ හදන ඒවා හොඳ වෙනවා.

ඒවගේ අරමුණක් සම්බන්ධයෙන් Objectively බැලුවත් පළමුවෙන් පහළ වෙන සිත්වල ආසාව ටිකක් වැඩියෙන් තිබෙන්න පුළුවන්. ඊළඟට දෙවෙනියට පහළ වෙන සිත් කාණ්ඩයට යනකොට ඒ ආසාව ටිකක් අඩුවෙනවා. ඊළඟට තුන්වෙනි කාණ්ඩයේ අන්තිම ජවන් සිත් වලට එනකොට තව ටිකක් ආසාව අඩුවෙනවා. පුහුණු වෙනවා කියන්නේ මේක දිගටම වැඩියෙන් වැඩියෙන් කරගෙන යෑමට. මෙහෙම

කරගෙන යනකොට කෙලෙස් බර අඩු වෙවී අඩු වෙවී කුසල ශක්තිය වැඩෙනවා. යෝනිසෝමනසිකාරය වැඩෙනවා.

අකුසලත් වැඩෙන්නේ මේ විදියටමයි. සුළු වශයෙන් පටන් ගත්ත අකුසලයක් වැඩිලා වැඩිලා පංචානන්තරිය පාප කර්මයක් දක්වා උනත් වැඩෙන්න පුළුවන්.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස පංචද්වාරා චිත්ත වීථිවලින් කර්ම කරෙන්නේ නැත්ද?

<u>පිළිතුර</u> - යන්තම් වෙනවා, ආරම්මණයට බැස ගැනීම වශයෙන් ආරම්මණය සලකන ගතියක් තිබෙනවා. නමුත් පස්වෙනි චිත්ත වීථියේ තිබෙන්නා වූ තරම් බලවත් කර්ම හැදෙන්නේ නෑ.

කර්ම තිබෙනවා ආකාර දෙකක්. එකකට ‘කර්ම’ කියලා කියනවා. අනිත් එකට ‘කර්මපථ’ කියලා කියනවා. කර්ම පථ බවට පත්වෙන්නේ පස් වෙනි චිත්ත වීථියේදී. අනිත් වීථි වලත් කර්ම රැස් වෙනවා, නමුත් ඒවායේ හයිය ගතියක් නෑ. ඒ කර්ම අඩු මට්ටමකින් විපාක දෙන්නත් පුළුවන් නැත්නම් නැතිවෙලා අහෝසි වෙලා යන්න පුළුවන්. නමුත් හැම කාණ්ඩයකම පහළ වෙන සිත් වලින් 5 වෙනි සිත් පේළියේ රැස්වන කර්මය සැර වැඩියි.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස පළවෙනි වීථිය විපාකයක්ද?

<u>පිළිතුර</u> - නෑ, මෙහෙමයි ඒකෙ තිබෙන්නේ

1	2	3	4	5	6	7	8	9	10	11	12	13	14	15	16	17
භ	ච	උ	ප	ච	ස	සං	වො	ජ	ජ	ජ	ජ	ජ	ජ	ජ	ත	ත

මේ චිත්ත වීථියේ

1 = භවාංග සිත = විපාකයක්
2 = භවාංග චලන = විපාක අවස්ථාවක්
3 = භවාංග උපච්ඡේද = විපාක අවස්ථාවක්
4 = පංච ද්වාරාවජ්ජන = ක්‍රියා සිතක්
5 = චක්ඛු විඤ්ඤාණය = විපාක සිතක්
6 = සම්පටිච්ඡනය = විපාක සිතක්
7 = සන්තීරණ = විපාක සිතක්
8 = වොත්ථපන = ක්‍රියා සිතක්
9 = ජවන් = කර්ම සිතක්
10 = ජවන් = කර්ම සිතක්
11 = ජවන් = කර්ම සිතක්
12= ජවන් = කර්ම සිතක්
13= ජවන් = කර්ම සිතක්
14= ජවන් = කර්ම සිතක්
15 = ජවන් = කර්ම සිතක්

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස එතකොට අපි practice කරනකොට කොහොමද?

<u>පිළිතුර</u> - මේ කිව්වේ theory එක. දැන් භාවනා කරනකොට ඇතුලත සිද්ධ වෙන විදිය තමයි දැන් කිව්වේ. ඒ උනාට අපි භාවනා කරන වෙලාවේදී අරමුණ සම්බන්ධයෙන් හිත ප්‍රතිචාර දක්වන විදිය බලාගෙන

ඉන්නවා ඇරෙන්න මේක මෙනෙහි කරන්නේ නෑ. නමුත් මේක තමයි සිද්ධ වෙන විදිය. අපි වාහනයක් පදවනකොට ඒ වාහනයේ ක්‍රියාකාරකම් ගොඩක් තිබෙනවා. ඒ තමයි රෝද හතර කරකැවෙනවා, engine එක start වෙලා තිබෙනවා, petrol පිච්චෙනවා, පිච්චෙන්න පිච්චෙන්න ඇතුලත තිබෙන valves වලින් petrol supply වෙනවා. Lights පත්තු වෙනවා. වේගය තිබෙනවා. මේ ඔක්කෝම ක්‍රියාකාරී කම් අපි වාඩිවෙලා ඉන්න වාහනේ තිබෙනවා, නමුත් අපි ඒ ඔක්කෝම ක්‍රියා ගැන හිත හිත යන්නේ නෑ. වාහනේ එළවන එක්කෙනා කරන්නේ ඉස්සරහ බලාගෙන එළවන එක විතරයි. එයා හිතුවේ නැති උනාට ඔක්කොම functions ටික තිබෙනවා. නමුත් යම්කිසි වෙලාවකදී ඇහුවොත් වාහනේ ආවේ කොහොමද කියලා එයාට විස්තර කරන්න පුළුවන්. වාහනයේ steering wheel එකක් තිබෙනවා, තෙල් පත්තු උනා කියලා ඒ ටික විස්තර කරගන්න පුළුවන් සමාන්‍ය මට්ටමකට. මේ mechanism එක හොඳටම දන්න එක්කෙනා වාහනය නවත්වලා තිබෙන කොට function එකයි වාහනය පදවනකොට තිබෙන functions ඔක්කොම විස්තර ඇතුව දන්නවා.
ඒ වගේ මේ සිත් වල ක්‍රියාකාරිත්වය දැනගෙන හිටියහම අපිට ඒවා හොඳට හඳුනා ගන්න පුළුවන්. එතකොට ඒක ධම්මානුපස්සනාවක් වෙනවා. සත්වයෝ නැති පුද්ගලයෝ නැති ආත්මයක් නැති ධර්ම ස්වභාව ටිකක් තමයි එකතරා විදියකට ක්‍රියාත්මක වෙන්නේ. අපි අර වාහනය පදවනකොට ඉස්සරහ බලාගෙන ඉන්නවා වගේ සිත ආරම්මණය පැත්තට හැරිලා ප්‍රතිචාර දක්වන හැටි මෙනෙහි කරනවා හැර ‘දැන් පංචද්වාරයක් ගියා, දැන් චක්ඛු විඤ්ඤාණයක් පහළ උනා’ කියලා එහෙම කරන්නේ නෑ.

<u>ප්‍රශ්නය</u> - ස්වාමීන්වහන්ස භවාංග චලනය කියන එක?

<u>පිළිතුර</u> - ඉස්සෙල්ලා තිබ්බ ස්වභාවයකින් වෙනස් වෙන්න යනකොට හිතේ තිබෙන වෙනස් වී යෑමට තිබෙන සූදානමට කියනවා භවාංග චලනය කියලා.

අතිමහන්තාරම්මණ - මහන්තාරම්මණ - පරිත්තාරම්මණ - අතිපරිත්තාරම්මණ කියලා චිත්ත වීථි තිබෙනවා. සමහර ආරම්මණ තිබෙනවා හරි ප්‍රකටයි. එතකොට අතිමහන්තාරම්මණ වීථියක් ඇතිවෙනවා. සමහර ආරම්මණ තිබෙනවා හරි සියුම්. එතකොට අරමුණ ප්‍රකට නැති නිසා ජවන් සිත් නැති චිත්ත වීථීත් පහළ වෙනවා.

උදාහරණයක් හැටියට කියනවා නම් හොඳට එළිය තිබෙන වෙලාවක මේසයක් හරි පුටුවක් හරි මේ ශාලාවේ තියලා තිබෙනවා. එතකොට ඒ එළිය තිබෙන නිසා අපිට ඒ මේසය හොඳට පේනවා. එතකොට හිතට පංචද්වාරාවජ්ජන වශයෙන් ඒ object එක capture කරගන්න හරිම ලේසියි. තවත් සමහර වෙලාවක අරමුණ තිබෙනවා නමුත් ඒ වෙලාවේ එතැන කළුවරයි. ලයිට් නෑ. අපි ඒ දිහා බලන කොට යම්කිසි දෙයක් තිබෙනවා නමුත් ඒක හරියට මොකක්ද කියලා එක පාරම හඳුනා ගන්න බෑ, අඳුර වැඩියි. එතකොට චිත්ත වීථි ගොඩක් යන්න වෙනවා ඒක හඳුනා ගන්න පමණක්.

මේ ක්‍රියාකාරී සවභාවයන් දැනගන්න හොඳ නුවණක් තිබන්න ඕනෑ. අපි හිතමු මෙහෙම. වෛද්‍යවරයෙක් අපිට බෙහෙත් වර්ගයක් දෙනවා. අපි ඒ ගැන දන්නේ කාරණා දෙකයි. බෙහෙත ඒකයි කියලා දන්නවා, ඒක බිව්වහම ලෙඩේ සනීප වෙනවා කියලා දැන ගන්නවා. නමුත් වෛද්‍ය වරයෙකුට පුළුවන් ඊට වඩා විස්තර දැන ගන්න. වෛද්‍ය වරයා දන්නවා ඒකෙ තිබෙන මූල ද්‍රව්‍ය මොනවද කියලා. ඒ මූල ද්‍රව්‍ය උදරය හරහා ගිහිල්ලා ලේ වලට එකතු වෙලා ලේ හරහා යන්නාවූ මේ ඖෂධය බැක්ටීරියාවල තැවරීගෙන යනකොට බැක්ටීරියා විනාස වෙනවා. බැක්ටීරියා විනාස උනහම අපහසුතාවය නැතිවෙනවා කියලා වෛද්‍ය වරයා දන්නවා. ඒ වගේ වැඩ සටහනක් තමයි දොස්තරලා කරන්නේ. නමුත් අපි දන්නේ නෑ බැක්ටීරියා කොහේ පදිංචි වෙලා ඉන්නවද කියලා, වෛද්‍යවරයා දන්නවා බැක්ටීරියා ඉන්නේ මේ පැත්තේ කියලා. ඒවගේම වෛද්‍ය වරයා බෙහෙත් ගන්න ඕන dose එකත් කියනවා, ඒවගේම ගන්න ඕනෑ වෙලාව ගන්න ඕනෑ දවස් ගාන කියනවා. ඒ කියන්නේ වෛද්‍ය වරයා දන්නවා ඒ බෙහෙත් එක සැරයක් අරගෙන හරියන්නේ නෑ, නැවත නැවත කීප සැරයක්ම නොනවත්වා ලේ සමග මේ බෙහෙත් අරින්න ගන්න ඕනෑ ඒ ලෙඩේ නැති කරන්න කියලා. අපි ඒ මොකක්වත් දන්නේ නෑ. අපි දන්නේ අපිට

තිබ්ච්ච ලෙඩෙත් ඒ බෙහෙතෙන් ඒ ලෙඩේ හොඳටම හොඳ උනා කියලා විතරයි. අපි ඒ ගැන අගේ කිරීමක් කරනවා. ඒ වගේ අපි දැනගෙන ඉන්න ඕනෑ කරන අපි පාවිච්චි කරන මේ සිත වලින් වෙන්නේ මේකයි කියලා.

සැමදෙනාටම තෙරුවන් සරණයි!

සාධූ! සාධූ! සාධූ!

ඉහත සඳහන් ධර්ම දේශනාව
අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.